# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 842 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 19/05/2024 පැය 0835

## මාධ්‍ය නිවේදනය

### වනාතවිල්ලුව ලැක්ටෝස් වත්ත ඉඩමෙහි ඉදි කරන ලද අධිබලැති උදුනෙහි ප්‍රථම වරට මත්ද්‍රව්‍ය තොගයක් විනාශ කිරීම.

විෂ මත්ද්‍රව්‍ය වලින් තොර සමාජයක් බිහිකිරීමේ අරමුණෙන් ශ්‍රී ලංකාවේ සියලුම පොලිස් ස්ථාන, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය, පොලිස් විශේෂ කාර්ය බලකාය සහ ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් මත්ද්‍රව්‍ය වැටලීම් පුළුල් කිරීමට කටයුතු කිරීමත් සමඟ විශාල වශයෙන් මත්ද්‍රව්‍ය තොග අත්අඩංගුවට ගන්නා ලදී. පසුගිය කාල සීමාව තුළ මෙසේ අත්අඩංගුවට ගන්නා ලද මත්ද්‍රව්‍ය තොග විනාශ කිරීම සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදු වූ අතර මේ සඳහා ස්ථිරසාර විසඳුමක් ලෙස ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකායට අයත් පුත්තලම වනාතවිල්ලුව ප්‍රදේශයේ පිහිටි ලැක්ටෝස් වත්ත ඉඩමෙහි මත්ද්‍රව්‍ය විනාශ කිරීම සඳහා අලුතින් අධි බලැති උදුනක් ශ්‍රී ලංකා පොලිසිය විසින් ඉදිකරන ලදි.

**මෙම ඉදිකරන ලද අධිබලැති උදුනේ ප්‍රථම වරට හෙරොයින් කිලෝග්‍රෑම් 251 ක් හා මෙතැම්පිටමින් හෙවත් අයිස් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 38 ක ප්‍රමාණයක්, 2024.05.18 වන දින ගරු මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් මැතිතුමාගේ හා පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ සහභාගිත්වයෙන් විනාශ කිරීමට කටයුතු කරන ලදී.**

අදාල මත්ද්‍රව්‍ය තොගය පුත්තලම ගරු මහේස්ත්‍රාත්තුමා, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නියෝජිතයින්, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ පූර්ණ විනිවිද බාවයකින් යුතුව සෙල්සියස් අංශක 800 – 1200 අතර දක්වා උෂ්ණත්වයකින් විනාශ කිරීම සිදු කරන ලදී.

මෙම අවස්ථාවට මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වියානි ගුණතිලක මහතා, වයඹ පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කිත්සිරි ජයලත් මහතා, පුත්තලම නියෝජ්‍ය පොලිස්පති නාලක සිල්වා මහතා හා පුත්තලම කොට්ඨාස භාර නිලධාරී ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කේ.එස්.කේ රූපසිංහ මහතා ඇතුලු පිරිසක්ද සහභාගී විය.

ඡායාරූප








NEWS
NEWS


Chief



SRI LANKA POLICE
හිරු
TV
ITN news



මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.